# ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 10 දරන අපරාධ යුක්ති විනිශ්චය කොමිෂන් සභා (සංශෝධන) පනත

[සභාතිකය සටහන් කළේ 1972 දෙසැම්බර් මස 6 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

(1972 දෙසැම්බර් මස 15 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි
කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරනු ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැකිය

# ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 10 දරන අපරාධ යුක්ති විනිශ්චය කොමිෂන් සභා (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1972 දෙසැම්බර් මස 6 වන දින]

එල්. ඩී.—ඕ. 66/72.

**1972 අංක 14 දරන අපරාධ යුක්ති විනිශ්චය කොමිෂන් සභා පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව විසින් 1972 අංක 14 දරන අපරාධ යුක්ති විනිශ්චය කොමිෂන් සභා පනත පවත්නා ලිඛිත නීතිය වශයෙන් වලංගුව තබාගෙන ඇති හෙයින් :

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 10 දරන අපරාධ යුක්ති විනිශ්චය කොමිෂන් සභා (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඩු නාමය.

2. මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන 1972 අංක 14 දරන අපරාධ යුක්ති විනිශ්චය කොමිෂන් සභා පනතෙහි 3 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— 1972 අංක 14 දරන පනතෙහි 3 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එම වගන්තියේ (4) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත සඳහන් අලුත් උපවගන්ති ඇතුළත් කිරීමෙන් :—

"(4 අ) කොමිෂන් සභාවේ යම් සාමාජිකයකු රෝගාතුර වීම නිසා නොපැමිණිය ද යම් විභාගයක නීතිකෘත්‍ය පවත්වාගෙන යනු ලැබිය හැකිය ;

(4 ආ) මේ පනත යටතේ කොමිෂන් සභාවක් විසින් පවත්වනු ලබන යම් විභාගයක දී කොමිෂන් සභාවේ සාමාජිකයකු නො පැමිණ සිටින විට යම් සාක්ෂිකරුවකු සාක්ෂි දී ඇති අවස්ථාවක ඒ සාක්ෂිකරු වැඩිදුරටත් පරීක්ෂා කිරීම සඳහා නැවත කැඳවීම අවශ්‍ය බව කොමිෂන් සභාව සලකතහොත් කොමිෂන් සභාව විසින් ඔහු එසේ නැවත කැඳවිය හැකිය." ; තවද

(2) එම වගන්තියෙහි (6) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත සඳහන් අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(6) මේ පනත යටතේ කොමිෂන් සභාවක් විසින් පවත්වනු ලබන විභාගයක් ආරම්භ කිරීම සහ පවත්වා ගෙන යාම යුක්ති ධර්මය කෙරෙහි යථා පරිදි සැලකිලිමත් ව, හැකි තාක් ඉක්මණින්, කළ යුතුය. ඒ අනුව—

(අ) යම් තැනැත්තකු හෝ යම් තැනැත්තකු වෙනුවෙන් පෙනී සිටින යම් උත්තරවාදියකු හෝ යම් ප්‍රශ්න යක් හෝ කරුණක් සම්බන්ධයෙන් කොමිෂන්

සභාව ඇමතීමට අදහස් කරන අවස්ථාවක ඒ ඇමතීමේ කාලය කොමිෂන් සභාව විසින් සීමා කළ හැකිය ; තවද එසේ කෙරෙන විට ඒ ඇමතීම ලියවිල්ලකින් ඉදිරිපත් කිරීමට නියම කළ හැකිය ;

(ආ) යම් තැනැත්තකු හෝ යම් තැනැත්තකු වෙනුවෙන් පෙනී සිටින උත්තරවාදියකු හෝ පැමිණ නො සිටීම හෝ ඒ විභාගයෙන් ඉවත්වීමට අදහස් කිරීම හෝ ඒ තැනැත්තා උත්තරවාදීන් වෙනස් කිරීමට කාලය ඉල්ලා සිටීම හෝ නො තකා කොමිෂන් සභාව විසින් විභාගය ආරම්භ කිරීම හෝ පවත්වාගෙන යාම හෝ කළ හැකිය :

එසේ වුව ද නියෝජනය කරනු නො ලැබූ චූදිත තැනැත්තකු පැමිණ නො සිටි විට සාක්ෂි දී ඇති යම් සාක්ෂිකරුවකු වැඩිදුරටත් පරීක්ෂා කිරීම සඳහා නැවත කැඳවීම අවශ්‍ය බව කොමිෂන් සභාව අදහස් කරතහොත් කොමිෂන් සභාව විසින් ඔහු එසේ නැවත කැඳවිය හැකිය ;

(ඇ) කොමිෂන් සභාවේ මතය අනුව කොමිෂන් සභාවට නැවත නැවතත් අගෞරව සම්පන්න වන්නා වූ යම් තැනැත්තකු හෝ උත්තරවාදියකු හෝ කොමිෂන් සභාව ඉදිරියෙහි පෙනී සිටීම තහනම් කිරීමට කොමිෂන් සභාවට සම්පූර්ණ බලය හා අධිකාරය තිබේ ; තවද

(ඈ) විභාගය ඉක්මණින් පවත්වාගෙන යාමේ කාර්යය සඳහා අවශ්‍ය බව කොමිෂන් සභාව සලකන වෙනත් පියවරවල් කොමිෂන් සභාව විසින් ගත හැකිය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය සංශෝධනය කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියෙහි 10 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) එම වගන්තිය ඒ වගන්තියේ (1) වන උපවගන්තිය වශයෙන් නැවත අංක කිරීමෙන් ; සහ

(2) එම වගන්තියේ නැවත අංක කරන ලද (1) වන උප වගන්තියට ඉක්බිතිව ම පහත සඳහන් අලුත් උප වගන්තිය ඇතුළත් කිරීමෙන් :—

" (2) 9 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද යම් සිතාසියක් ප්‍රකාර යම් තැනැත්තකු කොමිෂන් සභාව ඉදිරියේ පෙනී සිටීම හෝ ඔහු විසින් ඉදිරිපත් කළ යුතු බවට එකී යම් සිතාසියකින් නියමිත යම් ලේඛනයක් හෝ දෙයක් හෝ ඉදිරිපත් කිරීම පැහැර හරිතහොත් කොමිෂන් සභාව විසින් ඔහුට නියම කරනු ලබන යම්

දණ්ඩනයකට අතිරේක ව, කොමිෂන් සභාව ඉදිරියෙහි ඔහු පෙනී සිටින බවට වග බලා ගැනීමේ හෝ ඔහු විසින් ඒ ලේඛනය හෝ දෙය හෝ ඉදිරිපත් කරන බවට වග බලා ගැනීමේ හෝ කාර්යය සඳහා කොමිෂන් සභාවේ සභාපති ගේ අත්සන ඇතිව නිකුත් කරන ලද සිරභාරයට ගැනීමේ බලපත්‍රයක් පිට සිරභාරයට ගනු ලැබීමට හා රඳවා තබා ගනු ලැබීමට ඒ තැනැත්තා යටත් විය යුතුය. ".

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තියේ (ආ) ඡේදය වෙනුවට පහත සඳහන් අලුත් ඡේදය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය සංශෝධනය කිරීම.

" (ආ) මේ පනත යටතේ කොමිෂන් සභාවක් ඉදිරියේ පැවැත්වෙන යම් විභාගයක් අවසානයේ දී, ඒ විභාගයේ නීතිඥයා ගැන සැලකිලිමත් වූ විට හා ඒ විභාගයේදී කොමිෂන් සභාව ඉදිරියේ ඇති කරුණු සලකා බැලූ විට ඒ විභාගයට විෂය වූ යම් වරදක් යම් තැනැත්තකු විසින් කර ඇති බවට සාධාරණ සැකයකින් තොරව කොමිෂන් සභාව සෑහීමට පත් වන අවස්ථාවක කොමිෂන් සභාව විසින් ඒ වරදට ඒ තැනැත්තා වරදකරු බව නිගමනය කළ යුතු අතර, ශ්‍රේෂ්ඨාධිකරණය විසින් හෝ දිසා අධිකරණයක් විසින් හෝ මහෙස්ත්‍රාත් අධිකරණයක් විසින් හෝ නඩු විභාග කොට ඔහු වරදකරු කරනු ලැබුවේ නම් මරණය නොවන යම් දණ්ඩන නියමයක් ඔහු සම්බන්ධයෙන් නියම කළ හැකිව තිබුණේ ද ඒ දණ්ඩන නියමය ඔහු සම්බන්ධයෙන් කළ යුතුය :

එසේ වුව ද එවැනි යම් වරදකට නීතියෙන් විධිවිධාන සලස්වා ඇති එකම දණ්ඩන නියමය මරණය වූ අවස්ථාවක එවැනි යම් වරදකට වරදකරු බව නිගමනය කරනු ලැබූ යම් තැනැත්තකුට ජීවිතාන්තය දක්වා දෙ ආකාරයෙන් එක් ආකාරයක බණ්ධනාගාර ගත කිරීමේ දඬුවමක් නියම කිරීමට කොමිෂන් සභාවට බලය හා අධිකරණ බලය තිබිය යුතු ය.".

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 25 වන වගන්තිය මෙයින් ඉවත් කොට ඒ වෙනුවට පහත සඳහන් අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 25 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

"මේ පනත යටතේ නිගමන, දණ්ඩන නියමයන්, ආඥා, නිශ්චය කිරීම් හා නියමයන් අවසානාත්මක හා තීරණාත්මක විය යුතු බව.

25. කොමිෂන් සභාව විසින් මේ පනත යටතේ කරනු ලබන යම් නිගමනයක් හෝ නියම කරනු ලබන යම් දණ්ඩන නියමයක් හෝ කරනු ලබන යම් ආඥාවක් හෝ නිශ්චය කිරීමක් හෝ නියමයක්, අවසානාත්මක හා තීරණාත්මක විය යුතු අතර එය නඩුවක්, ප්‍රතිශෝධන ඉල්ලීමක්, අභියාචනයක් හෝ රිට් ආඥාවක් හෝ මාර්ගයෙන් නැතහොත් අන් ලෙසකින් කිසි ම අධිකරණයක දී හෝ විනිශ්චය අධිකාරයක දී ප්‍රශ්න නො කළ යුතුය. ".